**උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතිය (2014 මැයි 05 සිට) - 2014**

------------------------------------------------------------------

උපායශීලි නගර සංවර්ධන ව්‍යාපෘතියේ 2014 මැයි 05 සිට 2014 දෙසැම්බර් 31 දක්වා පළමු ගිණුම් කාල පරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය අතර 2014 සැප්තැම්බර් 12 දින එළඹි අංක 5428-එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ II (ආ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමට අනුව නාගරික සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ශ්‍රී ලංකාවේ සහභාගීත්ව ප්‍රාදේශීය නගර වල තෝරා ගත් නාගරික සේවා සහ පොදු නාගරික ස්ථාන වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ඒ අනුව ව්‍යාපෘතිය යටතේ නුවර නගරය සහ ගාලු නගරය ප්‍රාදේශීය සහභාගීත්ව නගර ලෙස දියුණු කිරීමට තෝරා ගෙන තිබුණි. මූල්‍ය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 25,162.48 ක සමාන වි.ගැ.හි. 95,000,000 (එජඩො මිලියන 192.08) ක් වන අතර ඉන් රු. මිලියන 19,257 ක සමාන එජඩො මිලියන 147 ක් ජාත්‍යන්තර සංවර්ධන සහයෝගීතාවය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 මැයි 05 ආරම්භ කළ අතර 2019 දෙසැම්බර් 31 අවසන් කිරීමට නියමිත විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4. විගණකගේ වගකීම**

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීමද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල

සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණුකළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමග ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිළි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම්පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි.ප්‍ර.) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගණකාධිකරණ අඩුපාඩු**

ව්‍යාපෘතිය විසින් සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී මිලදී ගත් දේපල, යන්ත්‍ර හා පිරියත සඳහා ක්ෂය ප්‍රතිපාදනය කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී මිලදී ගත් දේපල, යන්ත්‍ර හා පිරියත සටහන් කිරීමට ස්ථාවර වත්කම් ලේඛනයක් නිසි ආකාරව නඩත්තු කර නොතිබුණි. තවද වත්කම් වල භෞතික පැවැත්ම තහවුරු කර ගැනීම සඳහා මුදල් රෙගුලාසි අංක 756 හී අවශ්‍යතා අනුව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කිරීමට කටයුතු කර නොතිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යනය හා සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යනය සඳහා එකඟ වූ වටිනාකම | | සමාලෝචිත කාල පරිච්ඡේදය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදු කළ ප්‍රතිපාදන | 2014 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) | රු. (මිලියන) | එ.ජ.ඩො. (මිලියන) | රු. (මිලියන) |
| ජා.සං.ස. | 147.00 | 19,257.00 | 48.00 | 0.15 | 18.58 |
| ශ්‍රී.ලං.ර | 45.08 | 5,905.48 | 42.00 | - | 41.91 |
| | 192.08 | 25,162.48 | 90.00 | 0.15 | 60.49 |

**3.2 භෞතික ප්‍රගතිය**

**-----------------**

සමාලෝචිත කාල පරිච්ඡේදය තුළදී නුවර සහ ගාල්ල නගර සහා ප්‍රදේශ වැඩි දියුණු කිරීම වෙනුවෙන් ශක්‍යතා අධ්‍යන සහ විස්තරාත්මක තක්සේරු සකස් කිරීම සදහා පවත්වන ලද උපදේශන සේවා සමාලෝචිත කාල පරිච්ඡේදය අවසාන වන විට සැලකිය යුතු ප්‍රමාණයක් සම්පූර්ණ කර තිබුණි. ව්‍යාපෘතිය යටතේ ඉටු කළ යුතු යටිතල පහසුකම් සංවර්ධන කටයුතු 2014 දෙසැම්බර් 31 දිනට ආරම්භ කර නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘතිය සඳහා බඳවා ගැනීමේ ක්‍රමය 2014 ජනවාරි 29 වන දින අනුමත කර තිබුණි.කෙසේ වෙතත් නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ තනතුරු දෙකක් 2015 මැයි 31 දක්වා පුරප්පාඩුව පැවතුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂකට අනුව එම පුරප්පාඩු 2015 දී පුරවනු ලැබේ.